# 4 වන පාඩම

## කාලීන ගැටලු

ජන සමාජයේ සුරක්ෂිත පැවැත්මට ඇති ප්‍රබල ම අභියෝග ලෙස ස්වභාවික විපත් ,අනතුරු, අයහපත් ජීවන පුරුදු පෙන්වා දිය හැකිය.

- අනතුරු හා විපත් වල ස්වභාවය අනුව ප්‍රධාන කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය.
  එනම්:-

1. ස්වභාවික විපත්
   උදා : ගං වතුර
   නියඟය
   භූමිකම්පා
   සුනාමි
2. මිනිස් ක්‍රියාකාරකම් හේතු කොට ගෙන ඇති අනතුරු හා විපත්
   උදා : රිය අනතුරු.
   අනාරක්ෂිත ඉදිකිරීම් .
   පතල් හා කැණීම් කටයුතු .
   අක්‍රමවත් ලෙස කැලි කසල බැහැර කිරීම.

## ස්වභාවික විපත්

පෘථිවියේ හා එහි අවට පරිසරයේ ඇති වන මිනිසාට මෙන්ම පරිසරයට ඔරොත්තු නොදෙන ස්වභාවික තත්ත්ව මෙනමින් හැදින්වේ.

උදාහරණ : භූමිකම්පා
සුනාමි
අකුණු
ගං වතුර
නියඟය
කුණාටු

❖ ස්වභාවික විපත් ඇති වීමට ප්‍රධාන හේතු දෙකකි. එනම්,

- පෘථිවි අභ්‍යන්තරයේ සිදුවන භෞතික ක්‍රියාවලි.
- කාලගුණික හා දේශගුණික විපර්යාස .

❖ ස්වාභාවික විපත් නිසා සිදුවන හානි .

ජීවිත හානි
දේපොළ හානි

❖ ස්වභාවික විපත් ඇති වීමට හා ඉන් සිදුවන හානි උත්සන්න වීමට බලපාන විවිධ මිනිස් ක්‍රියාකාරකම් .

- වනාන්තර විනාශ කිරීම.
- පතල් කැණීම .
- ගංගාවලින් වැලි ගොඩ දැමීම .

❖ ස්වාභාවික විපත් අවම කර ගැනීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග .

I. කඩොලාන ශාක ආරක්ෂා කිරීම.
II. වනාන්තර විනාශ නොකිරීම.
III. කැලෑ ගිනි නොතැබීම.
IV. කොරල් පර කැඩීමෙන් වැළකීම.
V. අවධිමත් ලෙස ගංගාවලින් වැලිගොඩ දැමීමෙන් වැළකීම .

❖ අනතුරුවලින් හා විපත් වලින් සිදුවන හානි අවම කරගැනීමට ග ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග .

- අනතුරු හා විපත් පිළිබඳ අදාළ ආයතන මගින් කරනු ලබන දැනුවත් කිරීම පිළිබඳ සැලකිලිමත් වීම හා දෙනු ලබන උපදෙස් පිළිපැදීම.

- විපතට පත්වුවන් බේරා ගැනීම.
- නිවැරදි ප්‍රථමාධාර ලබා දීම.
- අනතුරු වැළැක්වීමට හා හානි අවම කිරීමට අදාළව සේවා සපයන ආයතන වලට ඒ පිළිබඳ දැනුවත් කිරීම.

❖ අනතුරු හා ආපදාවලදී සහය ලබා ගත හැකි ආයතන .

1) ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය
2) රෝහල .
3) පොලිසිය .
4) කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව.

❖ හදිසි අවස්ථාවලදී ඔබට සහය විය හැකි කෙටි දුරකථන අංක.

119 - පොලිස් හදිසි ඇමතුම් සේවා.

118 - ජාතික ආරක්ෂාව පිළිබඳ මෙහෙයුම් මධ්‍යස්ථානය.

1959 - ශ්‍රී ලංකා ජාතික රෝහල් තොරතුරු කේන්ද්‍රය.

110 - හදිසි ගිනි නිවීම් හා හදිසි ගිලන් රථ සේවාව.

*සුළි සුළං,ගංවතුර,අකුණු,නියඟ,කුණාටු,සුනාමි යන ස්වභාවික තත්ත්වයන් පිළිබඳ තොරතුරු සොයා සටහන් පොතේ කෙටි සටහන බැගින් ලියන්න.( පින්තූර අලවන්න)